අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/01/05/01 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2025.12. 16

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල් ප්‍රධානීන් (ප්‍රාථමික පන්ති පැවැත්වෙන රජයේ පාසල් හා රජයේ ආධාර ලබන/නොලබන පෞද්ගලික පාසල්)

**<u>2026 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම</u>**

උක්ත කරුණට අදාළ මාගේ සමාංක හා 2025.09.24 දිනැති ලිපිය සහ 'රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන් නැවත ආරම්භ කිරීම' යන මැයෙන් යුතු අංක ED/09/12/06/15/01-2025 හා 2025.12.09 දිනැති ලිපියේ 3.2 වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.

රජයේ පාසල්වල හා රජයේ ආධාර ලබන /නොලබන පෞද්ගලික පාසල්වල 2026 වර්ෂයේ පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම **2026 ජනවාරි මස 29 වැනි දා** (බ්‍රහස්පතින්දා දින) සිදු කිරීමට සැලසුම් කර ඇත. එදිනට පෙර පළමුවන ශ්‍රේණියට තෝරා ගත් සිසු දරුවන් පාසලට ඇතුළත් කිරීම සිදු කළ යුතු ය.

02. එදිනට පළමුවන ශ්‍රේණියේ සිසුන්ට විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීමට අදාළ පිළිගැනීමේ වැඩසටහන පහත අංග ඇතුළත් ව සිදු කිරීම යෝග්‍ය වේ.

- 2026 වර්ෂයේ දෙවන ශ්‍රේණියේ සිසුන් විසින් නවක සිසුන් පිළිගැනීම.
- දෙමාපියන් හා ආරාධිත අමුත්තන් පිළිගැනීම, ජාතික හා පාසල් ධජ එසවීම, ජාතික ගීය හා පාසල් ගීය ගායනය.
- ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, පළමුවන ශ්‍රේණියේ නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථ හා අරමුණු පිළිබඳ ව පළමුවන ශ්‍රේණියට පිවිසෙන සිසුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම.
- නවක සිසුන් පිළිගැනීම ප්‍රාථමික අංශයේ සිසුන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාසාංගික ලෙස සිදු කිරීම.

03. නවක සිසුන්ට ප්‍රමුඛ ස්ථානයක් ලැබෙන අයුරින් මෙම වැඩසටහන පැවැත්විය යුතු අතර සිසුන්ට හා දෙමාපියන්ට කිසිදු අපහසුතාවක් නොවන පරිදි වැඩසටහන සංවිධානය කිරීමට අවධානය යොමු කළ යුතු ය.

04. මෙම වැඩසටහන සාර්ථක ව පැවැත්වීමට පාසලේ සියලු ම අංශ සහ පාසල් සංවර්ධන සමිතිය හා ආදි ශිෂ්‍ය සංගමය ඇතුළු සියලු පාර්ශ්වවල සහයෝගය හා සහභාගිත්වය ලබා ගැනීම සුදුසු ය.

05. එසේ ම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශවලට අනුකූල ව පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සකස් කර ඇති <u>**දරුවන් හඳුනා ගැනීමේ**</u> වැඩසටහනේ (ප්‍රාථමික පාසලට ප්‍රීතිමත් ආරම්භයක්) **පළමු අදියර 2026 ජනවාරි 05 දින සිට 09 දින දක්වා ද, දෙවන අදියර ලෙස 2026 ජනවාරි 21 දින සිට ජනවාරි 22, 23, 26 සහ 27 දිනවල ද** ක්‍රියාත්මක කළ යුතු වේ.

06. දරුවන් හඳුනා ගැනීමේ වැඩසටහනට පසු ව පාසලට ඇතුළත් කර ගනු ලබන සිසුන් වෙනුවෙන් ද උක්ත අංක 05 ට අදාළ ක්‍රියාකාරකම් නම්‍යශීලී ලෙස සිදු කිරීමට පළමුවන ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ට උපදෙස් ලබා දිය යුතු ය.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශය අගය කරමි.

නාලක කළුවැව
ලේකම්

පිටපත් - 1. ගරු පළාත් ආණ්ඩුකාරතුමාගේ ලේකම්,.............................. - කරු. දැ.ගැ.ස.
2. පළාත් ප්‍රධාන ලේකම්, ............................... ........... - කරු. දැ.ගැ.ස.